**මාධ්‍ය නිවේදනය - 2023 අප්‍රේල් 04**

**රජය සතු ව්‍යාපාර 05 ක් සමඟ සාමූහික අභිලාෂ ප්‍රකාශ අත්සන් තැබීම.**

රාජ්‍ය ව්‍යාපාරවල කාර්යසාධනය, පාලනය, වගවීම සහ විනිවිදභාවය ශක්තිමත් කිරීමේ මෙවලමක් ලෙස සාමූහික අභිලාෂ ප්‍රකාශ අත්සන් කිරීමට 2022 අතුරු අයවැයේදී යෝජනා විය. එහි ආරම්භක පියවරක් ලෙස රජය විසින් තෝරාගත් රජය සතු ව්‍යාපාර 05 ක් සමඟ සාමූහික අභිලාෂ ප්‍රකාශ අත්සන් තැබීම 2023 අප්‍රේල් 04 වන දින ප.ව. 4.00 ට මුදල් අමාත්‍යාංශයේ "රන්දොර" ශ්‍රවනාගාරයේදී සිදු කෙරුණි.

සාමූහික අභිලාෂ ප්‍රකාශය යනු රජයේ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව එකඟ වූ කාල සීමාව තුළ රාජ්‍ය ව්‍යාපාරයන්හි මෙහෙයුම්, මූල්‍ය හා සේවා සැපයීමේ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා අත්සන් කරනු ලබන ත්‍රෛපාර්ශවීක ගිවිසුමකි.

රාජ්‍ය ව්‍යාපාරය නියෝජනය කරමින් එහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සභාපතිතුමාත්, සුපරීක්ෂක ආයතනය නියෝජනය කරමින් රේඛීය අමාත්‍යාංශයේ ලේකම් වරයාත්, මහජන අභිලාශ සුරක්ෂිත කිරීම හා රාජ්‍ය හිමිකාරීත්වය සම්බන්ධයෙන් මහාභාණ්ඩාගාරය නියෝජනය කරමින් මහාභාණ්ඩාගාර ලේකම්වරයාත් මෙම ත්‍රෛපාර්ශවීක ගිවිසුමට අත්සන් කරනු ලැබීය.

රාජ්‍ය ව්‍යාපාර, රාජ්‍ය අයවැයෙන් ස්වාධීනව හා වාණිජමය ශක්‍යතාවයෙන් යුතුව ක්‍රියා කිරීමේ හැකියාව මෙන්ම, ආයතන සම්පත් ප්‍රශස්ත උපයෝජනය

සහතික කරමින් රාජ්‍ය ආයෝජන සඳහා උපරිම ප්‍රතිලාභ මඟින් රාජ්‍ය ව්‍යාපාර පිහිටුවීමේ අරමුණු කරා ළඟා වීම  අපේක්ෂා කරණ අතර මේ සඳහා රාජ්‍ය ව්‍යාපාරවල අධ්‍යක්ෂ මණ්ඩලවල හා අනෙකුත් පාර්ශවවල වගකීම හා කැපවීම අවධාරණය කෙරේ.

සාමූහික අභිලාෂ ප්‍රකාශ තෝරාගත් රජය සතු ව්‍යාපාර සහ රේඛීය අමාත්‍යාංශ විසින් ඔවුන්ගේම කළමනාකරණ මෙවලම ලෙස භාවිතා කරනු ලබන්නේ කෙතරම් දුරකටද යන්න මත සාමූහික අභිලාෂ ප්‍රකාශ ක්‍රියාවලියේ සාර්ථකත්වය මූලික වශයෙන්ම රඳා පවතී. සාමූහික අභිලාෂ ප්‍රකාශයන්හි ප්‍රගතිය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මඟින් අධීක්ෂණය කරනු ලබන අතර, කාලානුරූපීව රාජ්‍ය ව්‍යාපාර ලඟාකරගත් ප්‍රගතිය පිළිබඳ වාර්තාවන් අමාත්‍ය මණ්ඩලයේ අවධානය පිණිස ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ.

මෙහි ආරම්භක පියවරක් ලෙස ජාතික ලොතරැයි මණ්ඩලය, සංවර්ධන ලොතරැයි මණ්ඩලය, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, හලාවත වැවිලි සමාගම හා කුරුණෑගල වැවිලි සමාගම, යන රාජ්‍ය ව්‍යාපාර 5 සඳහා අද දින සාමූහික අභිලාශ ගිවිසුම් අත්සන් කරනු ලැබීය. ඒ අනුව, ආයතනයේ සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය මෙම ඉලක්ක කරා ළඟාවීමට අවශ්‍ය ක්‍රමෝපායයන් ක්‍රියාවට නැංවීම සහ නිරන්තර අධීක්ෂණය සිදු කිරීම අපේක්ෂා කෙරේ.

මෙම වැඩපිළිවෙළ ක්‍රියාවට නැංවීම මත රජය විසින් වරින් වර අනෙකුත් රජය සතු ව්‍යාපාර  සමඟද සාමූහික අභිලාෂ අත්සන් කිරීමට අපේක්ෂා කෙරේ.